# ආගම සහ ගින්දර






ලක්ෂ්මන් කොඩිතුවක්කු

ආගම සමහර අවස්ථාවලදී සුදු ගින්දරකි එය ඉබේ නොඇවිලෙන මිනිසාටම පමණක් ඇවිලිය හැකි ගින්නකි මේ දිනවල ඉස්ලාම් ආගම අදහන මුස්ලිම් ලෝකය පුරාම ඇවිලී ඇති ගින්න සිඩ්නි නුවරටද කඩා පාත් වූයේ මාධ්‍යය ලෝකයටම අළුත් පුවත් මවමිනි. නබිනායකතුමන්ගේ චරිතය අළලා ඇමරිකානු පුරවැසිකම ලද අසැබි සිනමාකරුවකු විසින් නිර්මාණය කර යූ ටියුබ් වෙබ් අඩවියට මුදාහළ (ඉනසන්ස් ඔෆ් මුස්ලිම්ස්) ෂබබදජඑබජ‍ෑ දෙ එම්කසපි නැමැති මිනිත්තු දාහතරකට කෙටි කල චිත්‍රපටිය මුස්ලිම් ලෝකයම කළඹවාලීමට තරම් ප්‍රබල වූයේ ඇමෙරිකාවට හිතවත් මුස්ලිම් රටවල මිතුරුදම ද උඩු යටිකුරු කරමිනි. එමෙන්ම ලිබියාවේ සිටින අමෙරිකානු තානාපතිවරයා ද මරා දැමීමට තරම් උත්සන්න වූ මෙම ප්‍රශ්නය ලැව් ගින්නක් මෙන් තවමත් දසතම ඇවිලී යයි. අමෙරිකාව විසින් ඔසාමා බින් ලාඩන් මරා දමා සැහැල්ලුවෙන් හුස්ම ගන්නට උත්සහ ගන්නා කලක ඔහු වැනි ආගමික ගරිල්ලා නායකයකු විසින් බිහිකළ අල් කයිඩාව කිසිදාක විනාශ කළ නොහැකි බව, අමෙරිකාවටම පසක් කරමින් ගින්න තව තවත් ඇවිලෙයි. එමෙන්ම නායකයින් මරා දැම්මද, මිනිසුන් විසින්ම චිරාත් කාලයක් තිස්සේ තබාගත් විශ්වාසය හා ඇදහීම විනාශ කළ නොහැකි බවට කියා දෙන පාඩමක් බවට පත්වෙමින් අමෙරිකාව නැවත පුරුද්දන්නට දඟලන මුස්ලිමවරුන් හා ඔවුන් අතර හොඳ හිත තවත් මෙතුලින් ඈත්කර ඇත .

මෙරට වෙසෙන මුස්ලිම්වරුන් විසින් සිඩ්නි නගරයේ දියත් කළ විරෝධතා ව්‍යාපාරය පිළිබඳව මාධ්‍යවලට අදහස් දැක්වූ විවිධ ජාතීන්ගේ අදහස්වලට මමද කන් දුනිමි. පොලිසිය සමඟ ඇති වූ ප්‍රචණ්ඩ වාතාවරණය මැද පොලිස් භටයන් කිහිපදෙනෙකු තුවාල ලබා වාහනවලට අලාභහානි කිරීමට තරම් දුරදිග ගිය මෙම ප්‍රශ්නය නිසා අනෙක් ජාතීන් අතරද කැළඹීමක් ඇතිවූහ. කුඩා දරුවන් පවා සහභාගි වූ මෙම විරෝධතා රැළිය නිසා සාමකාමීව නිදහස්ව ජීවත්වන මෙරට වැසියන්ට අනාගතය පිළිබඳ බියක් උපදවන බව බොහෝ පිරිස් පැවසූහ. අවුරුදු තුනක තරම් වයසැති දරු-වෙකුගේ අතට පුවරුවක් දී එහි ලියා තිබූ " මුස්ලිම් ආගමට එරෙහිව යන උන් වෙඩිතබා මරා දැමිය යුතුයි" යන සටන් පාඨය තුළින්, මුස්ලිම්වරුන් තම දරුවන් අපරාධවලට හා පළිගැනීම්වලට දැන් සිටම හුරු කරන බව මාධ්‍යතුළින් පුන පුනා කී ඕස්ට්‍රේලියානු වැසියන් එය ළමා නීති උල්ලංඝනය කිරීමක් බවත්, එයට විරුද්ධව දැඩි නීති පැනවිය යුතු බවත් පැවසූහ. තමන් සාමකාමීව සිදුකළ විරෝධතා ව්‍යාපාරය අවුලක් බවට පත් කළේ පොලිසිය බව පවසන මුස්ලිම් විරෝධතාකරුවන්, නිව් සවුත් වේලස් පොලිසිය එයට වගකිව යුතු යැයි පැවසුවත් ප්‍රචණ්ඩ ක්‍රියාවලට සම්බන්ධවූවන් සොයා පොලිසිය මෙහෙයුමක් දියත් කළේ ඔවුන් අත් අඩංගුවට ගැනීමටය. ආගම, ජාතිය, පාට පිළිබඳව තමන්ට බේද නැති බවත්, නීතය හා සාමය ආරක්ෂා කිරීම පොලිසියේ වගකීම බවත් පැවසූ නිව් සවුත් වේල්ස්හි පොලිස් කොමසාරිස්, ප්‍රචණ්ඩත්වයට එරෙහිව කටයුතු කරන බවත් පවසා ඇත.

මුස්ලිම් ආගම දැඩි නීතිරීතිවලින් සමන්විත ආගමකි. එය අදහන පිරිස්ද එසේමය. අකුරටම පිළිපදිමන් ජීවිතය දෙන්නට වුවද සූදානම්ය මෙලොව ක්‍රිස්තියානි දහමට පසු වැඩි පිරිසක් අදහන ආගම මුස්ලිම් ආගමයි. අමෙරිකාව විසින් අරාබි ලෝකයම විනාශ කර තෙල් බලය අල්ලා ගත්තද, මුස්ලිම්වරුන්ගේ ආගම් බලය සමඟ සටන් කර ජයග්‍රහණය කළ නොහැකිය යන තැනට අද එම ප්‍රශ්නය පැමිණ ඇත. නබි නායකතුමන්ගේ චරිතයට අපහාස වන අයුරින් කවුරුන් හෝ කිසිවක් කරයිද, ඔවුන්ගෙන් පළිගැනීමට තරම් කුපිතවන්නට මුස්ලිමවරුන්ට එය ප්‍රමාණවත්ය. පකිස්ථානු ඇමතිවරයෙකු වසින් මෙම චිත්‍රපටයේ නිර්මාපකයන් මරා දැමුවහොත් ඩොලර් ලක්ෂ ගනන් පුදන්නට සැහැදී පැහැදී සටින්නේ එනිසාය විසි තිස් ගනන් මුස්ලිම්වරුන් මියයන්නේද ඒ නිසාය.

දර්ශනවාදීන්ට අනුව දෙවියන් වහන්සේ මැවූයේ මිනිසාය. මිනිසා විසින් නිර්මාණය කළ දේවල් බාහිර බලයක් බවට පත්වී මිනිසාම පීඩාවට පත් කිරීම නිසා මිනිසාගේ හදවතට ඉහළින් දෙවියන් වහන්සේ නිර්මාණය විය. එනිසා මිනිසුන් මෙලොවට ඒමට පෙර නිර්මාණය වූ සියලු දෑ දෙවියන් වහන්සේගේ නිර්මාණයක් යැයි කල්පනා කළ මිනිසු-න් දෙවියන්ව ආධිපත්‍යයට පත් කර සරණ සොයා යාමට පෙළඹුනහ. ආගම අබිං යැයි මාක්ස් පැවසුවේ මිනිසා විසින්ම නිර්මාණය කළ දෙවියන් වහන්සේ මිනිසාගේ බුද්ධිය හා සිහිය විකල් කරන හෙයිනි. මිනිසුන් මෙලොවට බිහිවීමේදී ආගම යනු හදවතක් නැති ලෝකයට හදවතක් විය. කරුණාව මෛත්‍රිය, නූපදින ක්‍රෝධය හා කුරිරු බවින් පිරි නොමිනිසත් ලොවට මිනිසාම විසින් නිර්මාණය කළ ආගම තුළින් සේවයක් ලබාගනු වෙනුවට ඔවුන් අද එය තමන්ගේම විනාශය කරා උපයෝගී කොට ගෙන ඇත. එනිසා ආගම අද ලෝකය තුළ තිරිංග තල කට්ටටම ගෙවී ගිය අබලන් වාහනයක් බවට පත්වෙමන් පවතී. තිරිංග නැති වාහනයක් නිදහස් මාර්ගයක ගමන් කරන්නාසේ ජනතාව විසින් ආගම නිසා අන් ජාතීන් හා තම ජාතීන්ද විනාශ කරන තැනට ලොව පැමණ ඇත.

තවමත් මෙලොව යම්තරමක් හෝ නිදහස් අදහස් දරමින් තර්කානුකූලව අදහස් ප්‍රකාශ කළ හැකි ආගම වන්-න් බුදු දහම බව මගේ හැඟීමයි. නොපෙනෙන දෙවියන් වෙනුවට මිනිසත් බව පිරි දර්ශනවාදී බුදුවරයකු දේශනා කළ දහම තවමත් මෙලොවට කෙතරම් උචිතදැයි සිතෙන්නේ සිදුවන දෑ පිළිබඳව උපේක්ෂාවෙන් බලා සිටිනවිටය. එහෙත් එය පිළිපදින නොව බුදුන් සේම දේශපාලකයින් අදහන මිනිසුන් ඉන්නා රටක ඇමතිවරයකු කීවේ අන්තිමේදී

# කුට්ටම් පොකුණ



තක්කඩියා සැඟවෙන්නේ ආගම තුළ බවයි. ඔහු එය කිවේ විපක්ෂ එල්ල කල චෝදනාවලටය. එයට හේතුව වූයේ පළාත් සභා ඡන්ද කාලයේදී ලංකාවට වැඩම්ම වූ කපිලවස්තු පුර සර්වඥ ධාතු ප්‍රදර්ශනය නිසාවෙනි. විපක්ෂය පැවසුවේ ජනතාව රැවටීම සඳහා ඡන්ද කාලය අල්ලා සර්වඥධාතූන් මෙරටට වැඩම්මවූ බවයි. එහෙත් රජය පවසන්නේ කලකට පෙර ඉන්දීය රජයෙන් ඉල්ලා සිටි ධාතු ප්‍රදර්ශනය සඳහා ලබාදුන් කාලයට පෙරම රජය ඡන්දයකට සූදානම් වූ බවයි. කෙසේ වෙතත් අද අපේ රටේ විපක්ෂය පැරදවීමට සර්වඥධාතූන් අවශ්‍ය නොවේ. මෙවැනි දුර්වල විපක්ෂයක් පැරදවීමට අවශ්‍ය වන්නේ විපක්ෂ නායක ඇතුළු විපක්ෂයේම තව කිහිප දෙනෙකු පමණි.

අපේ රටේ සෑම දේශපාලඥයෙකුම තක්කඩියෙකි. එය ආණ්ඩුවට සේම විපක්ෂයට පොදුය. එම තක්කඩියා අවි ආයුධ සේම ආගම තුළද වරින් වර සැඟවෙයි. එදා ආර ප්‍රේමදාස ජනාධිපතිවරයාට පුෂ්පකුමාර කී විපක්ෂය අද ආණ්ඩු කරයි. දේශපාලනයේ හැටි එහෙමය.

මුන්නේශ්වරම් කෝවිලේ බිලි පූජාව බිල්ලට ගනිමින් ජනතාව අතරට ගිය මර්වින් සිල්වා ඇමතිවරයා මිනිසුන්ටත් වඩා සත්වයින්ට කරුණාව දක්වන දේශපාලඥයෙකු බව කවුරුත් දනී. රූපවාහිනී සංස්ථාවේදී තමාට එරෙහිව ගිය සේවකයන් පසුපස

A.T. PARTNERS
Accountants & Business Advisors Pty Ltd

SOLE TRADERS !!!
SMALL BUSINESS OWNERS !!!

ARE YOU PAYING **MORE TAX** THAN YOU SHOULD?

LET US HELP YOU
**RESTRUCTURE YOUR BUSINESS**
**REDUCE YOUR TAX BURDEN**

- ✓ TAX PLANNING & BUSINESS ADVISE
- ✓ NEW BUSINESS REGISTRATION & COMPANY/FAMILY TRUSTS SETUPS
- ✓ INSTALLATION , SETUP & TRAINING OF ACCOUNTING SOFTWARE
- ✓ BAS, IAS, PAYG PREPARATION & LODGEMENT
- ✓ ASIC & ATO LIAISON, PAYMENT PLANS & TAX AMENDMENTS
- ✓ **INDIVIDUAL TAX RETURNS - $88* PER RETURN , 14 DAYS REFUND**
- ✓ TAX RETURNS FOR PARTNERSHIPS, COMPANIES, SMSFS & TRUSTS
- ✓ ADVISE ON NEGATIVE GEARING RE: SHARES & PROPERTY
- ✓ RENTAL PROPERTY & DEPREICIATION SCHEDULES
- ✓ ADMINISTRATION & COMPLIANCE OF SELF MANAGED SUPERANNUATION FUNDS

**CALL ACHINI TODAY** TO BOOK AN INITIAL **FREE** CONSULTATION ON

**0468 747 574** OR **03 8768 8630**

WE ARE IN YOUR FRIENDLY NEIGHBORHOOD AT **23 TOBIN WAY LYNDHURST**

**EVENING & WEEKEND APPOINTMENTS AVAILABLE**

**www.atpartners.com.au**